# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**11 ශ්‍රේණිය**

**කෘෂි හා ආහාර තාක්ෂණය - I**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 1 යි

<u>උපදෙස්</u>

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුරු තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x)යොදන්න.**

---

01) අතීත ශ්‍රී ලංකාවේ පැවති දියුණු වාරි තාක්ෂණය පිළිබඳ කදිම නිදසුනක් වන ජය ගඟ හෙවත් යෝධ ඇළ ඉදිකරන ලද්දේ

1) මහසෙන් රජතුමා විසිනි
2) ධාතුසේන රජතුමා විසිනි
3) අග්බෝ රජතුමා විසිනි
4) පරාක්‍රමබාහු රජතුමා විසිනි

02) ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට වර්තමානයේ වැඩිම දයකත්වයක් ලබා දෙන අංශය වනුයේ

1) කෘෂිකාර්මික අංශයයි
2) කාර්මික අංශයයි
3) සේවා අංශයයි
4) තාක්ෂණික අංශයයි

03) ශිෂ්‍යයෙක් පාශු වයනය සෙවීම සඳහා පස් ස්වල්පයක් තෙත්කර අත්ලෙහි තබා රෝල්කර මුදුවක් ලෙස සැකසීය. එම පස

1) වැලි පසකි
2) මැටි ලෝම පසකි
3) වැලි ලෝම පසකි
4) මැටි පසකි

04) pH අගය 4.5 - 6.5 අතර ආම්ලික තත්ත්වයේ පවතින පස උදසීන තත්ත්වයට පත් කිරීමට යෙදීමට වඩාත් සුදුසු වන්නේ

1) කාබනික ද්‍රව්‍යය
2) ජිප්සම්ය
3) හුණුය
4) දූව අළුය

05) පහත දැක්වෙන ප්‍රකාශ අතරින් දේශගුණික සාධක මැනීම සම්බන්ධ නිරවද්‍ය ප්‍රකාශ තෝරන්න.

A- වායුගෝලයේ උෂ්ණත්වය මැනීම සඳහා සරල උෂ්ණත්ව මානය භාවිතා වේ.

B- ආලෝක තීව්‍රතාවය මනිනු ලබන්නේ සූර්ය දීප්තමානය භාවිතයෙනි.

C- වර්ෂාපතනය පැවති කාලසීමාව හා තීව්‍රතාවය මැනීමට ස්වයංක්‍රීය වර්ෂාමනාය යොදා ගනී.

1) A හා B පමණි
2) A හා C පමණි
3) B හා C පමණි
4) A, B හා C යන සියල්ල

06)පස ක්ෂේත්‍රධාරිතා අවස්ථාවේ දී පවතින ජල ආකාර වනුයේ

1) කේෂාකර්ෂණ ජලය හා ජලාකර්ෂණ ජලයයි
2) ගුරුත්වාකර්ෂණ හා ජලාකර්ෂණ ජලයයි
3) කේෂාකර්ෂණ හා ගුරුත්වාකර්ෂණ ජලයයි
4) ජලාකර්ෂණ හා ආපද ජලයයි

07)අවසාදිත පාෂාණ වන හුණුගල් හා ඩොලමයිට් විපරීත වීමෙන් සෑදෙනුයේ

1) නයිස් පාෂාණය
2) තිරුවානාය
3) ග්‍රැනයිට්ය
4) කිරිගරුඬය

08)බෝග වර්ගීකරණය හා පලිබෝධ පාලනය අතර පවතින සබඳතාවය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- මිරිස් වගාවකින් පසු එම භූමියේ තක්කාලි වගා කිරීමෙන් හිටුමැරීම පාලනය වේ.
B- කුකර්බිටේසියේ කුලයේ බෝග වගාවකින් පසු වෙනත් කුලයක බෝගයක් වගා කිරීමෙන් ඉල්මාස්සාගේ හානිය පාලනය වේ.
C- වී වගා ක්ෂේත්‍රයකට තෝරා නසන වල්නාශක යෙදූ විට වී ශාක ඉතිරිව පළල් පත්‍ර වල් පැළෑටි විනාශ වේ.

මෙම ප්‍රකාශ අතුරෙන් සත්‍ය ප්‍රකාශ වන්නේ

1) A හා B පමණි
2) A හා C පමණි
3) B හා C පමණි
4) A, B හා C සියල්ලම

09)ගංගා දෙපස බහුලව ව්‍යාප්තව ඇති පස් කාණ්ඩය කුමක්ද?

1) රතු දුඹුරු පස
2) මැටි පස
3) රතු කහ පොඩ්සොලික් පස
4) දියලු පස

10)යාන්ත්‍රික බලයෙන් ක්‍රියාකරන ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයක් වන්නේ

1) රිජරයයි
2) රොටවේටරයයි
3) තැටි නගුලයි
4) දැති පෝරුවයි

11)ප්‍රදේශයක පරිසරයට අදළ තොරතුරු විස්තර කිරීමේදී වැදගත් වන සාධක කිහිපයක් පහත දැක්වේ.

A- ප්‍රධාන පස් කාණ්ඩය
B- උච්චත්වය
C- වන ගහනය

මෙම සාධක අතරින් පරිසර උෂ්ණත්වය කෙරෙහි බලපාන සාධක වනුයේ

1) A හා B පමණි
2) A හා C පමණි
3) B හා C පමණි
4) A, B හා C යන සියල්ල ම

12)වියළි කලාපයේ ජීවත් වන ගොවි මහතෙක් මහ කන්නයේ වී වගාව සඳහා බිම් සකස් කිරීම කළ යුතු කාලය වන්නේ

1) ඔක්තෝබර් - නොවැම්බර් මාසවලදී ය
2) ජනවාරි - පෙබරවාරි මාසවලදී ය
3) අප්‍රේල් - මැයි මාසවලදී ය
4) ජූලි - අගෝස්තු මාසවලදී ය

13)වාර්ෂික වර්ෂාපතනය $2500mm$ වැඩි හා උච්චත්වය $900m$ වැඩි ප්‍රදේශ අයත් වන්නේ

1) පහතරට තෙත් කලාපයටය
2) මැදරට තෙත් කලාපයටය
3) උඩරට අතරමැදි කලාපයටය
4) උඩරට තෙත් කලාපයටය

14)පහත ක්‍රියාකාරකම් අතරින් අතුරුයත් ගැමට අයත් කාර්යයක් ඇතුළත් වරණය තෝරන්න.

1) පස පෙරළීම, කැට පොඩි කිරීම හා පසට කාබනික ද්‍රව්‍ය මිශ්‍ර කිරීම
2) වල් මර්දනය, පැළ වටා පස් බුරුල් කිරීම හා පසට පොහොර මිශ්‍ර කිරීම
3) පස බුරුල් කිරීම, පස පෙරලීම හා ඇලි හා වැටි සැකසීම
4) පැළ මුලට පස් එකතු කිරීම, පාත්ති සැකසීම හා වල් මර්දනය

15)පසෙහි ලවණතාවය ඉවත් කිරීමට යොදා ගත හැකි ජල සම්පාදන ක්‍රමයකි.

1) විසිරි ජලසම්පාදනය
2) බිංදු ජලසම්පාදනය
3) පිටාර ජලසම්පාදනය
4) ඇලි ජලසම්පාදනය

16)සම්මත උස් පාත්තියක සිරස්කඩ පෙනුම පහත රූපයේ දැක්වේ.




ඉහත රූපයේ A හා B හි නිර්දේශිත මිනුම් අනුපිළිවෙළින් සෙන්ටිමීටර්

1) 100 හා 30 කි
2) 150 හා 45 කි
3) 90 හා 30 කි
4) 125 හා 50 කි

17)රසායනික පොහොර වර්ග කිහිපයක ලක්ෂණ පහත දැක්වේ.

A- අළු පැහැති ගෝලාකාර කැට
B- සුදු පැහැති කුඩා ගෝලාකාර කැට
C- ගඩොල් රතු පැහැති කුඩා ස්ඵටික

මෙම ලක්ෂණ සහිත පොහොර වර්ග පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

1) යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පේට්, මියුරියේට් ඔෆ් පොටෑෂ්
2) ත්‍රිත්ව සුපර් පොස්පේට්, යූරියා, මියුරියේට් ඔෆ් පොටෑෂ්
3) ඩොලමයිට්, යූරියා හා ඇමෝනියම් සල්ෆේට්
4) මියුරියේට් ඔෆ් පොටෑෂ්, යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පේට්

18)බෝගයට අවශ්‍ය පොහොර ද ජලය සමඟ මිශ්‍ර කර යෙදිය හැකි සූක්ෂම හා කාර්යක්ෂම ජල සම්පාදන ක්‍රමය වන්නේ

1) බිංදු ජලසම්පාදනය යි
2) ඉසින ජලසම්පාදනය යි
3) පිටාර ජලසම්පාදනය යි
4) බේසම් ජලසම්පාදනය යි

19)බෝග සඳහා පොහොර යෙදීම සම්බන්ධ වඩාත් නිවැරදි වරණය තෝරන්න.

1) මූලික පොහොරවල නයිට්‍රජන්, පොස්පරස් හා පොටෑසියම් යන පෝෂක ත්‍රිත්වයම තිබිය යුතුයි.
2) බෝගයට පොහොර යොදන අවස්ථාවේ දී පස වියළි තත්ත්වයේ තිබිය යුතුයි.
3) කාබනික පොහොර සමඟ රසායනික පොහොර යෙදීම බෝගයට හානිකරයි.
4) බෝගයට යෙදිය යුතු සම්පූර්ණ පොහොර ප්‍රමාණයම එකවර යෙදිය යුතුය.

20)පසේ දුර්වල ජලවහනය නිසා බෝග වලට සිදුවන තත්ත්වයක් වන්නේ

1) පසේ ස්වායු පාංශු ජීවීන් ගහනය වැඩිවීම.
2) බෝගයේ මූල පද්ධතිය ගැඹුරට වර්ධනය වීම.
3) බෝග මුල් ආශ්‍රිත රෝග අඩුවීම.
4) නිර්වායු ක්ෂුද්‍ර ජීවීන් මගින් කාබනික ද්‍රව්‍ය වියෝජනයෙන් මීතේන් වායුව නිපදවීම.

21)බඳුනක වගා කළ මිරිස් පැළයක මේරූ පත්‍ර කහ පාට වීම, වර්ධනය අඩු වී කුරුවීම, මල් හා ඵල විකෘති වීම දැකිය හැක. මෙම තත්ත්වය පාලනයට යෙදිය යුත්තේ

1) පොටෑසියම් අඩංගු පොහොරකි.
2) පොස්පරස් අඩංගු පොහොරකි.
3) නයිට්‍රජන් අඩංගු පොහොරකි.
4) කැල්සියම් අඩංගු පොහොරකි.

22)තවාන් පැළවල ප්‍රශස්ත වර්ධනයක් සඳහා තවාන් පාත්ති මතුපිටට යොදන තවාන් මිශ්‍රණයේ මතුපිට පස් හා කොම්පෝස්ට් අනුපාතය වන්නේ

1) 3:1 කි
2) 1:2 කි
3) 1:4 කි
4) 1:1 කි

23)පහත සාධක අතරින් බීජ ප්‍රරෝහණය සඳහා අත්‍යාවශ්‍ය සාධක වනුයේ

1) සූර්යාලෝකය හා කාබන්ඩයොක්සයිඩ් ය.
2) ජලය හා කාබන්ඩයොක්සයිඩ් ය.
3) සූර්යාලෝකය හා ඔක්සිජන් ය.
4) ඔක්සිජන් හා ජලය යි.

24)වල් පැළෑටි පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- වගා කරන ලද ප්‍රධාන බෝගයට අමතරව වැඩෙන ඕනෑම පැළෑටියක් වල් පැළෑටියක් වේ.
B- දිගු ජීවන චක්‍රයක් පැවතීම, සුළඟින් ව්‍යාප්ත වීම හා තන්තු මූල පද්ධතියක් පැවතීම වල් පැළෑටිවල ප්‍රධාන ලක්ෂණයකි.
C- සමහර වල් පැළෑටි රෝග කාරක ජීවීන්ට වාසස්ථාන සපයමින් ධාරක ශාක ලෙස ක්‍රියා කරයි.

ඉහත ප්‍රකාශ අතරින් වල් පැළෑටි පිළිබඳ නිරවද්‍ය ප්‍රකාශ වන්නේ

1) A හා B පමණි
2) A හා C පමණි
3) B හා C පමණි
4) A, B, C සියල්ලම

25)පහත වගුවේ බෝග වලට හානි කරන පලිබෝධකය, හානි කරන බෝග හා බෝගයේ හානි කරන කොටස නිවැරදිව සඳහන් කර ඇති පේළිය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| 1) | අවුලකපෝරා | කුකර්බිටේසි කුලයේ බෝග | පැළ වලට |
| 2) | ඉල්මැස්සා | කුකර්බිටේසි කුලයේ බෝග | ඵල වලට |
| 3) | පුරුක් පණුවා | සොලනේසි කුලයේ බෝග | පත්‍ර වලට |
| 4) | එපිලැක්නා | පොල් | පත්‍ර වලට |

26)වී වල පීදීමේ සිට අස්වනු මේරීම දක්වා ගතවන කාලය දින,

1) 30 කි
2) 45 කි
3) 60 කි
4) 50 කි

27)රෙරෙසෝම ලෙස හඳුන්වනු ලබන ස්වාභාවික වර්ධක ව්‍යුහ ඇත්තේ

1) ගහල හා හබරල වලය
2) ඇණු හා අර්තාපල් වලය
3) කහ හා ඉඟුරුවලය
4) කෙසෙල් හා අන්නාසිවලය

28) A හා B රූප වලින් දැක්වෙන්නේ වල්පැළෑටි වර්ග දෙකක් කඳේ හරස්කඩ පෙනුමයි.
එම වල්පැළෑටි සඳහා නිදසුන් නිවැරදිව දක්වා ඇති පේළිය තෝරන්න.

| | A | B |
|---|---|---|
| 1) | මාරුක් | කුඩමැට්ට |
| 2) | තැනැස්ස | බටදැල්ල |
| 3) | ඇටවරා | ජපන් ජබර |
| 4) | කුප්පමේනියා | කලාදුරු |




29) ශාක බද්ධ කිරීම සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A- ග්‍රහකයේ මූල පද්ධතිය හොඳින් වැඩුණු හා ශක්තිමත් වීම වැදගත් වේ.
B- අනුජය ඉහළ ගුණාත්මයක් සහිත අස්වනු ලබාදෙන ප්‍රභේදයක් විය යුතුය.
C- අංකුර හා රිකිලි බද්ධයේදී ග්‍රාහකයේ කැපුම් යෙදිය යුත්තේ පොළව මට්ටමේ සිට 45cm උසිනි.
බද්ධ කිරීම හා සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශ වන්නේ

1) A හා B පමණි
2) A හා C පමණි
3) B හා C පමණි
4) A, B හා C පමණි

30) පාලිත තත්ත්වය යටතේ බෝග වගා කිරීමට භාවිතා කරන ස්ථිර වගා ව්‍යූහයක් වන්නේ

1) සරල සූර්ය ප්‍රචාරක ය
2) ඒකීය සූර්ය ප්‍රචාරක ය
3) හරිතාගාර ය
4) පාත්ති ආවරණය

31) වාණිජ මට්ටමේ පැළ නිපදවීමේ දී මුල් ඇදීම වේගවත් කිරීමට රසායනික උත්තේජක භාවිතා වේ.
එවැනි වර්ධක හෝමෝනයකි.

1) ඒත්‍රල් ද්‍රාවණය
2) ඇල්බට් මිශ්‍රණය
3) ඉන්ඩෝල් ඇසිටික් අම්ලය
4) මීතයිල් ඉයුජිනෝල්

32) නිර්පාංශු වගාවේදී පෝෂණ මාධ්‍ය ලෙස බහුලව භාවිතා කරනුයේ,

1) ඇල්බට් මිශ්‍රණය
2) ඒත්‍රල් ද්‍රාවණය
3) ඒගාර් මාධ්‍ය
4) සුක්රෝස් ද්‍රාවණය

33) ශිෂ්‍යයෙක් පාසල් ගොවිපලේ තිබූ පත්‍ර මත පුල්ලි සහිතව මැලවී ගිය තක්කාලි පැළයක කඳ කොටස කපා පිරිසිදු ජල බඳුනකට දැමූ විට දුම්වැටියකින් පිටවන දුම හා සමාන ස්‍රාවයක් ජලයට වැස්සෙනු නිරීක්ෂණය කළේය. මෙවැනි තත්ත්වයක් ඇති වීමට හේතුව වන්නේ

1) දිලීර රෝගයකි
2) වෛරස් රෝගයකි
3) වටපණු රෝගයකි
4) බැක්ටීරියා රෝගයකි

34) පුද්ගලයෙකුගේ ශරීර ස්කන්ධ දර්ශකය (BMI) ගණනය කිරීමට අත්‍යවශ්‍ය මිනුම වන්නේ

1) උපත් බර හා වයසයි
2) රුධිරයේ සීනි මට්ටම හා උසයි
3) ශරීරයේ බර හා උසයි
4) උස හා පපුවේ ප්‍රමාණයයි

35) යම් භූමියක පස, ජලය හා පෝෂක තත්ත්වය හා ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි අවම යෙදවුම් භාවිතයෙන් පරිසරය සුරක්ෂිත කරන ගොවිතැන් ක්‍රමයකි.

1) හේන් ගොවිතැන
2) සංරක්ෂිත ගොවිතැන
3) සමෝධානිත ගොවිතැන
4) ශෂ්‍ය බෝග මාරුව

36)තවාන් පාත්ති සැකසීමේදී සිදුකරන ක්‍රියාකාරකම් හා ඊට හේතුව නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

1) තවාන් පිළිස්සීම - පසේ ආම්ලිකතාවය උදසීන කිරීම
2) තවාන් වසුන් කිරීම - තෙතමනය, උෂ්ණත්වය ආරක්ෂා කිරීම හා වල් මර්දනය
3) පැළ ගැලවීම ආසන්න විට ජලය යෙදීම අඩුකිරීම - පැළ ගැලවීම පහසු කිරීමට
4) බීජ වලට දිලීර නාශක මිශ්‍ර කිරීම - බීජවල ජීවත් වන කෘමින් මර්දනය කිරීම

37)එක් බෝගයක ජීවන චක්‍රය අවසන් වීමට පෙර එම භූමියේම තවත් බෝගයක් වගා කරමින් එකම භූමියේ බෝග දෙකක් හෝ කිහිපයක් වගා කිරීම

1) අතුරු බෝග වගාවයි
2) මිශ්‍ර බෝග වගාවයි
3) කඩින් කඩ වගාවයි
4) ශෂ්‍ය බෝග මාරුවයි

38)පසු අස්වනු හානි පිළිබඳව පහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශ තෝරන්න.

A- නෙලන ලද අස්වනු ක්ෂේත්‍රයේ ගොඩ ගසා තිබීමෙන් ක්ෂේත්‍ර තාපය නිසා මාංශල අස්වනු රෝග කාරක ආක්‍රමණ වලට ලක්වෙයි.

B- අස්වනු නෙළීමේදී නියමිත මේරීමේ අවධියේ දී නෙලා ගැනීමෙන් පසු අස්වනු හානි අවම කර ගත හැකිය.

C- ගොවියාගේ බෝග අස්වනුවල විකුණුම් මිළත් පාරිභෝගිකයා විසින් වෙළෙන්දට ගෙවිය යුතු මිළත් අතර පරතරය වැඩි වීමට පසු අස්වනු හානි හේතු වේ.

1) A හා B පමණි
2) A හා C පමණි
3) B හා C පමණි
4) A, B, C සියල්ලම

39)ආහාර නරක් වීමට භෞතික සාධක, රසායනික සාධක හා ජීව විද්‍යාත්මක සාධක හේතු වේ. ආහාර නරක් වීමට හේතුවන රසායනික සාධකයක් වන්නේ

1) ආහාර මත දිලීර ක්‍රියාකාරිත්වය
2) පරිසර උෂ්ණත්වය
3) ආහාර තුළ සිදුවන එන්සයිමීය ක්‍රියා
4) ආහාරයේ තෙතමනය

40)වකුගඩු ආශ්‍රිතව කැල්සියම් ඔක්සලේට් තැන්පත් වී මුත්‍රා ගල් ඇති වීමට ප්‍රධාන සාධකයක් වන්නේ

1) ප්‍රෝටීන අඩංගු ආහාර අඩුවෙන් ගැනීම
2) ලෝහ බඳුන්වල ආම්ලික ආහාර පිසීම
3) ක්ෂුද්‍ර ජීවී ආසාදනයට ලක්වූ ආහාර ගැනීම
4) හාල් මැස්සන් හා තක්කාලි සමග නිතර ආහාරයට ගැනීම